**ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතිය (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය) 2016**

-----------------------------------------------------------------------------------------------------------

ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල්-පී 108 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------

ව්‍යාපෘති ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතානයනය වේ. ජාතික මාර්ගවල ප්‍රධාන පාලම් ඉදි කිරීම මගින් ජාතික මාර්ග ජාලය වැඩි දියුණු කිරීම හා එමගින් ආර්ථික සංවර්ධනය සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 27,250 කට සමාන ජපන් යෙන් මිලියන 16,132 ක් වන අතර ඉන් රු. මිලියන 20,914 කට සමාන ජපන් යෙන් මිලියන 12,381 ක් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 මාර්තු මාසයේදී ආරම්භ කරන ලද අතර 2018 ජූලි වන විට අවසන් කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණ විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ

විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්‍ෂා කිරීම්ද එම පරීක්‍ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද වන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද වන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්‍ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

--------------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

විනිමය අවාසි ගැලපීම් නොකිරීම නිසා එකතු රු. මිලියන 382 ක වැඩ පූර්ව අත්තිකාරම් රු. මිලියන 4 කින් වැඩිපුර දක්වා තිබුණි.

### 2.2.2 නොසැසඳු ශේෂයන්

------------------------

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) ව්‍යාපෘතිය පාලම් 25 නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය සමඟ පවත්වාගෙන යන අන්තර් ජංගම ගිණුමේ ලැබිය යුතු ලෙස පෙන්වා ඇති රු. මිලියන 1.42 ක ශේෂයක් ඊට අනුරූපිව අදාල ව්‍යාපෘති ජංගම ගිණුමේ ගෙවිය යුතු ශේෂ ලෙස පෙන්නුම් කරන රු. 669,195 සමඟ එකඟ වී නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට අවසන් කළ ව්‍යාපෘති කටයුතු ආධාර අරමුදල් ව්‍යාපෘති 3 ක ප්‍රධාන වශයෙන් සංවේදි ප්‍රවාහන පද්ධති ව්‍යාපෘතිය, දිළිඳුකම පිටුදැකීමේ නැගෙනහිර යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය හා මන්මුනෙයි සංවර්ධන ව්‍යාපෘතිය ආපසු අයකර ගැනීම් සැකසහිත වුවද, ලැබිය යුතු ශේෂ එකතු රු. මිලියන 74.66 ක් 2016 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂ ලෙස දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

--------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම් | උපයෝජනය කල අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2016 වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දින දක්වා | |
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ජ ජාසනි | 12,381 | 20,914 | 2,150 | 1,629.70 | 2,163.11 | 3,671.48 | 4,488.97 |
| ශ්‍රී ලං ර | 3,751 | 6,336 | 205 | 95.04 | 120.24 | 180.76 | 228.68 |
| **එකතුව** | **16,132** | **27,250** | **2.355** | **1,724.74** | **2,283.35** | **3,852.24** | **4,717.65** |

නැවත ඉදිකිරීම් කටයුතු සඳහා ණය දෙන ආයතනය රු. මිලියන 20,914 කට සමාන ජපන් යෙන් මිලියන 12,381 ක් වෙන්කර තිබුණු අතර ඉන් රු. මිලියන 4,488.97 කට සමාන ජපන් යෙන් මිලියන 3,671.48 ක් නියෝජනයවන සීයයට 29.65 ක් පමණක් 2016 දෙසැම්බර් 31 දිනට උපයෝජනයකර තිබූ බව නිරීක්ෂණය විය. තවද ණය මුදලින් වියපහදම් නොවූ ශේෂයන් සඳහා රු. මිලියන 13.76 ක බැදීම් ගාස්තු ණයදෙන ආයතනය සමාලෝචිත වර්ෂයේදී ආපසු අයකරගෙන තිබුණි. සවිස්තරාත්මක සමස්ථ සැලසුම් සමඟ ප්‍රධාන කාර්ය මණ්ඩල වගකීම් පැහැදිලිව හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ඉලක්ක ආදිය පිලියෙල කර නොතිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති ලියකියවිලිවලට අනුව පළාත් 5 ක ප්‍රධාන පාලම් 37 ක් නැවත ඉදිකිරීමට අපේක්ෂා කර තිබුණි. එම නිසා පාලම් 37 නැවත ඉදිකිරීම් කොන්ත්‍රාත් පැකේජ් 5 ක් යටතේ ප්‍රදානය කිරීමට පිලියෙලකර තිබුණි. ඉන් දකුණු හා උතුරු පළාත්වල නැවත ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 02 ක් පමණක් ඇස්තමේන්තු පිරිවැය පිලිවෙලින් රු. මිලියන 7,098 කට සමාන ජපන් යෙන් මිලියන 5,666 ක් හා රු. මිලියන 3,785 කට සමාන ජපන් යෙන් මිලියන 3,126 කට 2016 දෙසැම්බර් 31 දින ප්‍රදානය කර තිබුණි.
දකුණු පළාතෙන් ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල ප්‍රධන පාලම් 10 නැවත ඉදිකිරීම් 2015 මාර්තු 20 දින ආරම්භකළ අතර ඒවායේ භෞතික ප්‍රගතිය අපේක්ෂිත ප්‍රගතිය සැසඳීමේදී 2016 දෙසැම්බර් 31 දිනට සියයට 90.37 ක් ප්‍රගතියක් අපේක්ෂාකල අතර එදිනට ප්‍රගතිය සියයට 73.19 ක පමණක් පැවතුණි. තවද උතුරු පළාත් යාපනය, කිළිනොච්චිය හා මන්නාරම දිස්ත්‍රික්කවල ප්‍රධාන පාලම් 08 නැවත ඉදිකිරීම් වැඩ වසර 2 ක ප්‍රමාදව සහිත 2016 නොවැම්බර් 24 දින ප්‍රදානය කර තිබූ අතර එම පාලම්වල නැවත ඉදිකිරිම් වැඩ 2016 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භකර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

දකුණු පළාතේ කෙරීගෙන ගිය පාලම් නැවත ඉදිකිරීම් වැඩවල පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොල්වත්ත පාලම, කොළදණ්ඩ පාලම හා කිහිඹිඇල පාලම යන පාලම්වල නැවත ඉදිකිරීම් වැඩ දින 18 සිට දින 73 ක ප්‍රමාද කාල පරාසයක් සහිතව නිම කර තිබුණි.

(ආ) ගාල්ල මාතර දිස්ත්‍රික්කවල නැවත ඉදිකිරීම් පාලම් 10 ක රු. මිලියන 7,098.09 ඉංජිනේරු ඇස්තමේන්තු අවස්ථා 19 කදී සිදුකල විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් විචලන හේතුවෙන් රු. මිලියන 7,112.80 දක්වා වැඩි වී තිබුණි. ව්‍යාපෘතිය ප්‍රමාණපත් පිළියෙල කිරීමට පෙර විධිමත් විස්තරාත්මක ඉංජිනේරු අධ්‍යයනයක් සිදුකර නොමැති බව පෙන්නුම් කෙරෙණි.

(ඇ) ගාලු දිස්ත්‍රික්කයේ පොල්අතුමෝදර පාලම රු. මිලියන 80.71ක ඇස්තමේන්තු පිරිවැයකට ප්‍රධානය කර තිබු අතර එහි ව්‍යුහාත්මක දුර්වලතා හේතුවෙන් රු. මිලියන 17.69 ක් වටිනා වැඩ නිම කිරීමෙන් පසු නවතා තිබුණි. ඒ හේතුවෙන් අලුත් පාලමක් නිර්මාණ වැඩ සඳහා රු. මිලියන 32.29 ක අතිරික්ත මුදලක් ව්‍යාපෘතිය වැය කර තිබුණි.

(ඈ) ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල පිහිටි පාලම්වල වීදි අලෝකකරණය සඳහා මුල් ප්‍රමාණපත්වල රු. මිලියන 34.47 ක් වෙන් කර තිබුණු අතර පසුව භාවිතාකරන මගීන්ගේ ආරක්ෂාව ගැන සැලකිලිමත් නොවී ඉවත් කර තිබුණි.

(ඉ) සබරගමුව පළාතේ කෑගල්ල, රත්නපුර හා කුරුණෑගල දිස්ත්‍රික්කවල නැවත ඉදිකිරීම් සඳහා මුලින් හඳුනාගෙන තිබු පාලම් 09 ක් අවලංගු කොට ඒ වෙනුවට වෙනත් පාලම් 09 ක් ආදේශකර තිබුණි ඒ නිසා මුලින් තෝරාගත් පාලම් 09 හි නිර්මාන සැලසුම් සඳහා උපදේශකවරුන්ට ගෙවූ රු. මිලියන 1.27 නිශ්ඵල වියදමක් බවට පත්විය.

## 3.4 ව්‍යාපෘතියේ ඉඩම් අත්පත්කර ගැනීම හා නැවත පදිංචි කිරීමේ කටයුතු

---

2015 මාර්තු 20 දිනට පෙර නිම කිරීමට සැලසුම්කර තිබු දකුණු පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ඉඩම් අත්පත්කර ගැනීමේ කැබිලි 310 කින් කැබිලි 07 ක් සඳහා ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 17 වන වගන්තිය යටතේ රු. මිලියන 71.55 පමණක් වන්දි ලෙස ගෙවා තිබුණු අතර තවද ඉඩම් කැබිලි 02 ක වන්දි වශයෙන් රු. මිලියන 14.63 ක් අදාල අයිතිකරුට ගෙවා තිබුනද එම ඉඩම් 2017 අප්‍රේල් මස අවසන් වනතුරු කොන්ත්‍රාත්කරුට භාරදී නොතිබුණි. තවද, ආදාල පර්ශවයන් වෙත රු. මිලියන 3.57 ක් ගෙවා තිබුණද උපයෝගී සේවා නැවත ස්ථානගත කිරීම ප්‍රමාද වී තිබුණු අතර එය නැවත ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යැමට බාධාවී තිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

---

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කාර්යය මණ්ඩල 62 ක් අනුමතකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සමාජිකයින් 32 කුගෙන් සමන්විත විය. සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන ඉංජිනේරු තිදෙනෙකු ව්‍යාපෘති ඉංජිනේරු හයදෙනෙකු, තාක්ෂණ නිලධාරීන් නවදෙනෙකු ඇතුළුව තනතුරු 39 ක් පිරවීමෙන් තොරව පැවතුණු අතර එය ව්‍යාපෘතියේ කටයුතු කාර්යක්ෂමව මෙහෙයවීමට බාධාවී තිබුණි. තවද සැහැල්ලු උපකරණ මෙහෙයුම්කරුවන් තිදෙනකු කළමනාකරණ සහකාර 04 ක් ඇතුලත් පුද්ගලයින් 09 දෙනෙකු අනුමත කාර්ය මණ්ඩලයේ නොමැතිව සේවයේ යොදවා රු.මිලියන 4.24 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.